# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,712—1941ක්වූ පෙබරවාරි මස 14 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

දැන්වීමයි.

වර්ෂ 1941ක්වූ පෙබරවාරි මස 7වෙනි දින නො. 8,709 දරණ ලංකාණ්ඩුවේ "ගැසට් පත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ 65වෙනි පිටේ ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම් සටහනේ ප්‍රසිද්ධකර තිබෙන කළුතර දිස්ත්‍රික්කයට අයිති දියකඩුව ගමේ පිඹු. 136 දරණ අවසාන ගම් සිතියමේ නො. 1 දරණ අතිරේකයේ නො. 355 දරණ කට්ටිය ආණ්ඩුවට ලබාගැනීම ගැන දැනුම්දෙන වගනම්:—එකී දැන්වීමේ අයිතිකාරකියන්නා වශයෙන් ඒ. ඇම්. අමරසිංහ දොස්තරහාමි කියා තිබුණේවී නමුත් එය එසේනොවී, ඒ. ඇම්. සමරසිංහ දොස්තරහාමි කියා කියවන්ට ඕනෑ බව මෙයින් දන්වමිහ.

පී. ජේ. හඩ්සන්,<br>
කළුතර ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1941ක්වූ පෙබරවාරි මස 11වෙනි දින<br>
කළුතර කච්චේරියේදීය.

---

### වැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L J 258.

ආණ්ඩුවේ ඉඩම් බදුදීම.

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුවේ ඉඩම වර්ෂ 1941ක්වූ මාර්තු මස 1වෙනි දින පටන් අවුරුදු දෙකකුත් මාස 7කට බදුදීමට ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දැනුම්දෙමි.

2. මෙම මුද්‍රකරණලද ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1941ක්වූ පෙබරවාරි මස 28වෙනි සිකුරාදා දවල් 11 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඒවා අඩංගු කවරවල පිටපැත්තේ "P. P. 14,349යේ නො. 893 දරණ කට්ටිය බදුගැනීම පිණිසයි" කියා සටහන්කළ යුතුයි. ඉල්ලුම්පත්‍ර ගැබෑබව ඔප්පු වීමට ඉල්ලුම්කරන්නාවූ සියලුදෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙනීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. වැඩි ඉල්ලුම්කාරයා ගැනුම්කාරයා වේ.

2. හයමාසයකට වැටෙන බදුමුදල විනිශ්චිත තිබුන දවසේම ඇප වශයෙන් මුදලෙන් ගෙවිය යුතුයි. බදු මුදල අවුරුදු කාර්තුවෙන් කාර්තුවට ගෙවන්ට ඕනෑය. එය කාර්තුවක් පැමිණෙන්ට කලින් ගෙවන්ට ඕනෑය.

3. බදුකාරයාට අයිතිව තිබෙන්නේ ස්ථිර වගාවක් නොකර ඉඩම වවා එහි ප්‍රයෝජනය ගැණීම පමණක්ය.

4. බදුකාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට ඉඩමේ තිබෙන ගස් කපන්ටවත් දැනට පවතින මායිමක් හෝ වැටක් වෙනස් කරන්ටවත් අවසර නැත.

5. බදුකාරයා විසින් බදුගත් ඉඩමේ වැටබඳින්ට ඕනෑය කියා ඒජන්ත උන්නාන්සේ විසින් අණකරන්ට යෙදුනොත් එසේ වැටවල් බඳින්ට බදුකාරයා බැඳෙනවා ඇත.

6. බදුකාරයා ඉඩම සුද්දෙන් සහ හොඳකාර තබාගන්ටත් නාගරික සභාවේ අණපණත්වල හැටියට පිළිපදින්ට සහ එහි නියමවල හැටියට බදුගෙවන්ටත් ඕනෑය.

7. කිසිම වන්දියක් නොගෙවා බදුකාරයාට මාස තුනකට ප්‍රථම දැනුම්දී ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ හෝ උන්නාන්සේගේ බලය යටතේ ක්‍රියාකරණ කොයිම කෙනෙකුට තුමූත් ඉඩමේ භුක්තිය නැවත භාරගැනීමට කොයිකම්විටකදී තුමූත් අයිත්වාසිකම තබාගන්නා ඇත.

8. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් ගන්නාලද අවසරයක් නැතුව ඉඩමේ බද්ද කිසි කෙනෙකුට පවරන්ටවත්, නැවත බදුදෙන්ටවත් බදුකාරයාට බලය නැත.

9. කිරි තිබෙන එළදෙන්නු, මීදෙන්නු, එළුවන්, ඌරන් යනාදි සිව්පාවුන්ට ඉඩමට තණකොළ කෑමට එන්ට ඉඩනොදිය යුතුයි. එවැනි සිව්පාවුන් ඒජන්ත උන්නාන්සේ හෝ උන්නාන්සේගෙන් බලයලත් කෙනෙකු විසින් අල්ලනු ලැබේ. මේ තහනම ගැන නාගරික සභාවේ නිලධාරීන්ට තිසියාකාර කටයුතුකිරීමට බදුකාරයා ඉඩදෙන්ට ඕනෑය.

10. මුර ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑකාලෙක මාසයක් කල්දුන්විට ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම හෝ ඉඩම් කොටසට ගනුවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට යනවෙන්ට තිබෙන කාලයට ගෙවා තිබෙන බදු මුදලින් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

11. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව කිසිම ගොඩනැගිල්ලක්, මඩුවක්, තේ කෝපි කඩයක් ඉඩමේ ඇතිකරන්ට තහනම්ය.

12. ඉහත සඳහන් කොන්දේසි කඩකලොත්, පහත දක්වන පරිදි ක්‍රියාකිරීමට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ:—

(a) සම්පූර්ණ ඇප මුදල හෝ ඒජන්තතුමාට වැටෙන පරිදි සෑහෙන කොටසක් රජසන්තක කිරීමවත්,

73——J. N. A 1662—111 (2/41)

(b) කිසියම් වන්දි මුදලක් නොගෙවා, ඉඩම නැවතත් භාර ගෙන, බදුකාරයා සහ ඔහුගේ වැඩකාරයින් ඉඩමෙන් අස්කිරීමටත්ය.

එසේ ඉඩම නැවත භාරගත් පසු, ඇප මුදලෙන් යම් කොටසක් ඉතිරිව තිබේ නම් එම මුදල බදුකාරයාට ආපසු ගෙවනු ලැබේ.

13. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නා ඇත.

ඩබ්ලිව්. ජී. හොබ්ඩේ,
බස්නාහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

මේ 1941ක්වූ පෙබරවාරි මස 5වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඉඩමේ තොරතුරු.

මුල් සිතියමේ නො. 14,349.

| හිමි කට්ටිය. | පිහිටීම. | අන්දම. | බිම්කරම, ඇ. රූ. ප. |
|---|---|---|---|
| 893 | නාරංගස්පිටිය .. | තණඉඩම .. | 2 1 31·75 |

## සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාධිපතිගේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙයින් ප්‍රකාශ කරන්නේනම් මධ්‍යම දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය මේ 1941ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 10 පැය පටන් මහනුවර මගුල්මඩුවේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට නියමදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එසින් පිටතාට යන්ට නුසුළුවන් බවත් මෙයින් සැම්දෙනාටම දන්වන්නෙමි.

ජී. පී. ඩයිසන්,
මධ්‍යම දිසාවේ පිස්කල් වමිය.

මේ 1941ක්වූ පෙබරවාරි මස 10වෙනි දින
මහනුවර පිස්කල් කන්තෝරුවේදීය.